# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2130/42 – 2019 ජූලි 04 වැනි බ්‍රහස්පතින්දා – 2019.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/22/40/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.10.28 දිනැති හා අංක 1729/22 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.10.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බදුල්ල, පිංඅරාව, ජලනල මාවත, අංක 24/4බී හි පදිංචි එල්. එස්. පියදාස මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.05.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**සී. එන්. විතානාච්චි,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රාජකාරි ආවරණය),
කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට.

2019 ජූනි මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 30453 – 13 (2019/07)


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*යොමු අංකය:* IR/22/40/2009.

## කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

එල්. එස්. පියදාස, අංක 24/4/බී, ජලනල මාවත, පිංඅරාව, බදුල්ල.

*නඩු අංකය:* A/3414

*ඉල්ලුම්කරු*

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

*වග උත්තරකරු*

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධවයි.

## තීන්දුව හා ප්‍රදානය

මෙහි පහත නම් සඳහන් (මෙහි මින්මතු ඇතැම් තැනක ඉල්ලුම්කරු යැයි හැඳින්වෙන) පළමුවන පාර්ශ්වය වශයෙන් බදුල්ල, පිංඅරාව, ජලනල මාවත, අංක 24/4/බී හි පදිංචි එල්. එස්. පියදාස මහතා ද, දෙවන පාර්ශ්වය වශයෙන් (මෙහි මින්මතු ඇතැම් තැනක වගඋත්තරකරු යැයි හැඳින්වෙන) කොළඹ 05, කිරුළ පාර, අංක 200, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය ද අතර පවත්නා කාර්මික ආරවුලක් සම්බන්ධයෙන් කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතාගේ අංක IR/22/40/2009 හා 2011.10.20 දින දරන ලිපිය මගින් ඉහත කී ගරු අමාත්‍යවරයා වෙත 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) (දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කරන ලදී.

(2) එසේම ඉහත කී පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් වරින්වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ පරිදි නිවාඩු ලබා නොදීම හා සේවයේ ස්ථිර නොකිරීමෙන් ඔහුට ලැබිය යුතු සේවා තත්ත්වයන් හා වරප්‍රසාද අහිමි වී ඇති බැවින් සිදු වූ මුදල්මය පාඩුව ගෙවන ලෙසට එල්. එස්. පියදාස මහතා විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද? එසේ වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ, යනුවෙන් කම්කරු කොමසාරිස්ගේ අංක අයිආර්/22/40/2009 සහ 2011.09.12 දින දරන ලිපිය මගින් දක්වා ඇත.

(3) මේ අනුව ඉහත කී පාර්ශවයන් විසින් අදාළ පළමු හා දෙවන ප්‍රකාශ ගොනු කිරීමෙන් පසුව බේරුම්කරණය විසින් මෙම ආරාවුල සමථයකට පත් කිරීම සඳහා විවිධ උත්සාහයන් ගන්නා ලද නමුදු ඒවා අසාර්ථක වීම නිසා නඩුව විභාගයට ගැනීමට සිදු විය. ඒ අනුව ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත එම්. කේ. හේමපාල මහතා පෙනී සිටි අතර ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු ද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වූ ද දශක 3 1/2 කාලයක් ශ්‍රී.ලං.ග.ම. විධායක ශ්‍රේණියේ විවිධ තනතුරුවල සේවකයෙකු වන වයි. එම්. උපසේන මහතා ද සහකාර කම්කරු කොමසාරිස් තේජා ප්‍රියදර්ශනී දසනායක මහත්මිය ද සාක්ෂි දුන් අතර ඔවුන් මගින් A1 සිට A29 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

(4) වගඋත්තරකරු වෙනුවෙන් රජයේ අධි නීතිඥවරුන් විවිධ අවස්ථාවල දී පෙනී සිටිය අතර අවසාන වශයෙන් රජයේ නීතිඥ හේෂානි කලුබෝවිල මෙනෙවිය පෙනී සිටින ලදී.

(5) වගඋත්තරකරු වෙනුවෙන්, නියෝජ්‍ය මානව සම්පත් කළමණාකාර හේවා ගමගේ සමන්ත කුමාර සහ ගණකාධිකාරි ඉන්දික ප්‍රියන්ත බාලසූරිය යන අය සාක්ෂි දුන් අතර නඩු විභාගයේ දී ආර්1 සිට ආර්6 දක්වා වූ ලේඛන ලකුණු කරමින් නඩුව අවසන් කරන ලදී.

(6) අනතුරුව බේරුම්කාර මා විසින් තම ලිඛිත සැලකිරීම් හා ලකුණු කළ ලේඛන ගොනු කරන ලෙසට දෙපාර්ශවයට දන්වන ලද අතර, වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඔවුන්ගේ 2019.02.20 දින දරන ලිපිය සමග තම ලිඛිත සැල කිරීම් හා ලකුණු කළ ලේඛන ගොනු කර ඇත. අනතුරුව, ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් 2019.03.01 දින දරන ලිපියත් සමග ඉහත කී ලිඛිත සැලකිරීම් හා ලකුණු කළ ලේඛන ගොනු කර ඇත.

(7) ඒ අනුව බේරුම්කාර මා විසින් තීරණය කළ යුතුව ඇත්තේ ඉහත කී යොමුව පරිදි ඉල්ලුම්කාර එල්. එස්. පියදාස මහතාට යොමුවේ දක්වා ඇති පරිදි ඔහුට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් වරින්වර නිකුත් කරනු ලබන චක්‍රලේඛන පරිදි නිවාඩු ලබා නොදීම හා සේවයේ ස්ථිර නොකිරීමෙන් ඔහුට ලැබිය යුතු සේවා තත්ත්වයන් හා වරප්‍රසාද අහිමි වී ඇද්ද? එසේ නම් ඔහුට සිදු වූ මුදල්මය පාඩුව ගෙවන ලෙසට එල්. එස්. පියදාස මහතා විසින් කරනු ලබන ඉල්ලීම් යුක්ති සහගත ද? එසේ යුක්ති සහගත වන්නේ නම්, ඔහුට හිමිවිය යුතු සහන මොනවා ද යන්නය.

(A) ඉහත සඳහන් ඉල්ලුම්කාර පාර්ශ්වයේ වාචික සාක්ෂිත්, ලකුණු කළ ලේඛනත්, වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිත්, ලකුණු කළ ලේඛනත් සමස්ථයක් වශයෙන් සලකා බැලීමේ දී ඉහත සඳහන් වගඋත්තරකරුගේ ස්ථාවරය ප්‍රතික්ෂේප කිරීමටත් ඉල්ලුම්කාර පාර්ශ්වයේ ස්ථාවරය පිළිගැනීමටත් බේරුම්කාර මම තීරණය කරමි.

(8) එසේ තීරණය කිරීමට හේතු වූ කරුණු නම්,

(*a*) කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දුත් අනුව බේරුම්කරුගේ නියෝගය සාධාරණ හා යුක්ත සහගත විය යුතු වීම. (Just and equitable)

(*b*) ඉල්ලුම්කාර පාර්ශ්වයේ ස්ථාවරය වාචික සාක්ෂි මගින් හා ලකුණු කරන ලද ලේඛනවලින් බේරුම්කරණය සෑහීමකට පත් වන පරිදි සත්‍යතා වැඩිබර රීතියට අනුකූලව තම ඉල්ලීම සනාථ කර තිබීම.

(*c*) ඉල්ලුම්කාර පාර්ශ්වයේ පළමුවන ප්‍රකාශයෙන් දක්වා ඇති පරිදි මෙම ආරවුල වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වීම.

(*d*) බදුල්ල සහකාර කම්කරු කොමසාරිස්ගේ 2016.06.15 දින දරන ලිපිය (A/24) මගින් මෙම ආරවුල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයෙන් නිසි සැලකිල්ලක් නොදැක්වීම. (A/27)

(*e*) මෙම කම්කරු ආරවුල විසඳා ගැනීමට ඉල්ලුම්කාර පක්ෂයට වසර 10ට වැඩි කාලයක් (එනම් අවුරුදු 13 පමණ) ගතවීම.

(*a*) කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දුත් අනුව බේරුම්කරුගේ නියෝගය සාධාරණ හා යුක්ත සහගත විය යුතු වීම. (Just and equitable)

(9) කොළඹ මහ නගර සභාව එදිරිව මුණසිංහ 71 N.L.R. 223 (SC) නඩුවේ දී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ දක්වා ඇත.

The discretion which the Industrial Disputes Act confers on an Arbitrator to make an Award which is ''just and equitable'' must be exercised in a reasonable manner. The award must be ''just and equitable'' as between the parties to the disputes in question the fact that one party might have encountered ''hard times'' because at personal circumstances for which the other party is in no way responsible is not a ground on which justice or equity requires the other party to make undue concessions ''An Arbitrator half no license from the Legislature to make any such award as the may please, for nothing is just and equitable which'' is decided by whom or caprice or by the toss of a double – headed coin''.

<u>Heath company Ceylon limited Vs Kariyawasam 71-N.L.R. 382(SC) නඩුවේ දී ද මෙම නීති තත්ත්වය පිළිගෙන ඇත.</u> (Hussain's complete Digest of Case law at Srilanka volume 13 by Mr. Hussain Mohomad. Pages 99-100)

(10) <u>නඩුවේ පසුබිම</u>.

(1) ඉහත කී ආරවුල පවත්නා දෙපාර්ශ්වයන් අතර ආරවුලට හේතු වූ කරුණු වශයෙන් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ පරිදි නිවාඩු ලබා නොදීම, සේවයේ ස්ථිර නොකිරීම හා ඔහුට ලැබිය යුතු සේවා තත්ත්වයන් සහ වරප්‍රසාද අහිමිවී ඇති බැවින් සිදු වූ මූල්‍යමය පාඩුව පියවන ලෙසට එල්. එස්. පියදාස මහතා විසින් කරන ලද ඉල්ලීම යුක්ති සහගත ද? යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ. මෙහිදී ඉල්ලුම්කරු 2003.10.05 වන දින අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇති බැවින් සේවය ස්ථිර කිරීම සහ වරප්‍රසාද පිළිබඳව බේරුම්කරණයේ අවධානය යොමු නොවීය. හුදෙක් අවධානය යොමු වී ඇත්තේ ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉල්ලා සිටිනු ලබන මූල්‍යමය පාඩුව සාධාරණ නැද්ද? යන්න සහ එය සිදු වුයේ හුදෙක් වගඋත්තරකාර පාර්ශ්වයේ කටයුතු නිසා ද යන්න ය.

(11) මේ පිළිබඳව වගඋත්තරකාර පාර්ශ්ව විසින් ගොනුකර ඇති 2011.11.16 දිනැති පිළිතුරු ප්‍රකාශය මගින් වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශකර ඇත්තේ මෙම ඉල්ලුම්කරු මොණරාගල ඩිපෝවේ කාර්මික රියැදුරු (අනියම්) වශයෙන් සේවය කරමින් සිටිය දී සිය කැමැත්තෙන් සේවය අතහැර ගොස් ඇති බැවින් බව දක්වා ඇත.

(12) පසුව ඉහත කී පිළිතුරු ප්‍රකාශයට ප්‍රතිචාරයක් ලෙස 2012.02.23 දින දරන ප්‍රතිඋත්තර ප්‍රකාශය මගින් මෙම ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ වගඋත්තරකරු විසින් තමන්ව ස්ථිර සේවකයකු බව සලකා කටයුතු කර ඇති නමුත් ස්ථිර පත්වීමක් හෝ ස්ථිර සේවකයෙකුට හිමි නිවාඩු හිමිකම් ලබා නොදීමත් ය.

(13) වගඋත්තරකාර ගමනාගමන මණ්ඩලය 2005 අංක 28 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මගින් ඊට පෙර පැවති ජනතා සන්තක ප්‍රවාහන සේවයේ ද පොකුරු බස් සමාගම්වල ද වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට බාර ගන්නා ලදී. ඊට අදාළ කොටස A28(a) දරන ලේඛනයේ දක්වා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වගඋත්තරකරු වශයෙන් නම් කර ඇත.

(14) ඒ අනුව මෙම බේරුම්කරණය විසින් මෙම ආරවුල සම්බන්ධයෙන් විසඳිය යුතුව ඇති ප්‍රශ්න වන්නේ,

(අ) ශ්‍රී.ලං.ග.ම.ය විසින් වරින්වර නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ පරිදි නිවාඩු ලබා නොදීම හා සේවයේ ස්ථිර නොකිරීමෙන් ඔහුට ලැබිය යුතු සේවා තත්ත්වයන් හා වරප්‍රසාද අහිමි වී ඇත්තේ ද?

(ආ) එසේ අහිමි වී ඇත්නම් එකී මූල්‍යමය පාඩුව ගෙවන ලෙසට එල්. එස්. පියදාස මහතා කරන ලද ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද?

(ඇ) එම ඉල්ලීම යුක්ති සහගත වන්නේ නම් ඉල්ලුම්කරුට ලැබිය යුතු සහන කවරේ ද? යන්නය. (පිටුව 08)

(b) ඉල්ලුම්කාර පාර්ශ්වයේ ස්ථාවරය වාචික සාක්ෂි මගින් හා ලකුණු කරන ලද ලේඛන වලින් බේරුම්කරණය සෑහීමකට පත්වන පරිදි සත්‍යතා වැඩිබර රීතියට අනුකූලව තම ඉල්ලීම සනාථ කර තිබීම.

ඉල්ලුම්කාර පක්ෂයෙන් කැඳවන ලද ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වූ සහ ලංකා ගමනා ගමන මණ්ඩලයේ විවිධ තනතුරු දරමින් වසර 30ක පමණ කාලයක් සේවය කළා වූ ද දැනට වෘත්තීය සමිති නියෝජිතයෙකු වශයෙන් සේවය කරනු ලබන වයි. එම්. උපසේන මහතාගේ සාක්ෂි ඉල්ලුම්කාර පක්ෂපාතීව සාක්ෂි දුන්නේ යැයි වගඋත්තරකරු 2019.02.20 දින දරන ලිඛිත ප්‍රකාශය මගින් ඉහත කී වයි. එම්. උපසේන මහතාගේ සාක්ෂි බැහැර කරන ලෙස ඉල්ලා ඇතත් එසේ කිරීමට මා මැලිවන්නේ හුදෙක් අනියම් සේවකයින් හා සියලු සේවකයින් සම්බන්ධයෙන් ඉහත කී උපසේන මහතා කටයුතු කර තිබීමත් උපාධිධාරියෙකු වීමත් යන කරුණු සලකාය. යම් පක්ෂයක් විසින් තම සාක්ෂිවලට කැඳවනු ලබන්නේ තමන්ගේ ස්ථාවරය තහවුරු කිරීමට බව අමුතුවෙන් කිව යුතු නොවේ.

(15) එසේ හෙයින් එම සාක්ෂිවලට මාගේ අවධානය යොමු කරමි. ඔහු සාක්ෂි දී ඇත්තේ ඉල්ලුම්කරු අවුරුදු 07 මාස 10ක් අඛණ්ඩව සේවය කර ඇති බවත් ඔහුට නිවාඩු ලබා දී නොමැති බවත්ය.

(16) Colombo apothecary co VS Ceylon printing union නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිවාඩු යනු වරප්‍රසාදයක් මිස අයිතියක් නොවන බවට උපරිමාධිකරණය තීරණය කර ඇති බවට දක්වා ඇති වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත සැළකිරීම් වල දක්වා ඇති කරුණු කෙරෙහි මෙම බේරුම්කරණය එකඟ වන නමුත් එසේ වරප්‍රසාදය සාධාරණ හා යුක්ති සහගතව ලබාදිය යුතු බව බේරුම්කරුගේ අදහසයි.

(17) එසේ හෙයින් මෙම ඉල්ලුම්කරුට ඒ අනුව සාධාරණ හා යුක්ති සහගතව නිවාඩු ලබා දී නොමැති බවත් පැහැදිලිව ඔප්පු කර ඇත.

(18) එසේම ඉල්ලුම්කරු කම්කරු දෙපාර්තමේන්තුවේ බදුල්ල ශාඛාවට පැමිණිලි කර ඇත්තේ එය හේතුකොට ගෙනය.

(19) එසේ හෙයින් ඔහු ලැබූ වැටුප් මත 1995.12.01 දින සිට නිවාඩු ලැබූ දින 252 1/2 සඳහා රු. 46,832.47 සහ වන්දි මුදලක් වශයෙන් සාධාරණ වන්දි මුදලක් ද ලබා දෙන ලෙස බදුල්ල සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් නියෝගයක් කර ඇත්තේ එම හේතුව නිසාය. ඒ බව A24 ලේඛනයෙන් දැක්වේ.

(20) මෙම මුදල් ඉල්ලුම්කරුගේ වැටුපෙන් අඩු කර ඇත. හුදෙක් අනියම් සේවකයන්ට නිවාඩු ලබා දෙන ආකාරය පැහැදිලි වන A3 හා A26 දරන චක්‍රලේඛවල දක්වා ඇත. එකී ලේඛනවල සත්‍ය පිටපත් බවට බදුල්ල ගමනාගමන මණ්ඩලයේ සමවායේ ගණකාධිකාරිනී ටී. කේ. චන්ද්‍රානි මහත්මිය විසින් සහතික කරන ලදුව A26 හා A3 ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත් කර ඇතත් එහි ගණකාධිකාරිවරයා VRS මගින් විශ්‍රාම ලබා ඇති බැවින් ඇය සාක්ෂියට නොකැඳවන ලද නමුත් ඇයගේ අත්සන තමන් දන්නා බවත් ඉහත උපසේන මහතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත. එසේ තිබිය දී වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර සමන් කුමාර මහතාගෙන් ද හරස් ප්‍රශ්නවල දී විමසා ඇත.

''හරියටම කියන්න බෑ'' යනුවෙන් පවසන ලදුවත් ඔහුගේ සාක්ෂියේ එකී කොටස බැහැර කරමින් උපසේන මහතාගේ සාක්ෂි පිළිගැනීමට මම තීරණය කරමි.

එසේම ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් සාක්ෂි දුන් සහකාර කම්කරු කොමසාරිස් තේජා ප්‍රියදර්ශනී දසනායක යන අයගේ සාක්ෂිවලින් ද පැහැදිලිව සනාථ වී ඇත.

එසේ හෙයින් එම ලේඛන 2 ඔප්පු කිරීමේ භාරයෙන් නිදහස් කිරීමට තීරණය කරමි.

(21) ඉල්ලුම්කාර පාර්ශ්වයේ ස්ථාවරය වාචික සාක්ෂි මගින් ද ලකුණු කරන ලද ලේඛනවලින් ද බේරුම්කරණය සෑහීමකට පත්වන පරිදි තම ඉල්ලීම සනාථ කර ඇත.

(22) ඉහත කී ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂිවලින් ද මෙසේ ප්‍රකාශ කර ඇත. (2013.08.30) වන දින සාක්ෂි සටහන්හි පිටු 55, 56 පිටු)

ප්‍ර: එහිදී ඔබට ලැබිය යුතුව තිබූ නිවාඩු ලැබුණේ නැහැ කිව්වා නේද?

උ: ඔව්.

ප්‍ර: වගඋත්තරකාර ආයතනයෙන් නොලැබුණු වැටුප සඳහා මුදලක් ඉල්ලා සිටියා ද?

උ: ඔව්.

ප්‍ර: මේ අවස්ථාවේ දී තමා සාක්ෂිකරු වශයෙන් 2012 පෙබරවාරි 23 වන දින සංශෝධිත දෙවන ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබුවා නේද ?

උ: ඔව්.

ප්‍ර: එහි තමා යම් නිවාඩු දින ගණනක් සඳහා වැටුප් ඉල්ලා සිටිනවා නේද ?

උ: ඔව්.

මේ අනුව A24 ලේඛනය පරිදි බදුල්ල සහකාර කම්කරු කොමසාරිස් විසින් අදාළ වැටුප ගෙවන ලෙසට ඌව ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට නියම කර ඇත.

ප්‍ර: හුදෙක් ඔබ අනියම් තත්ත්වයට පත් වුණේ 1995 වර්ෂයේ ද ?

උ: ඔව්.

(2013.08.30 දින සාක්ෂි සටහන - පිටුව 58)
ඉල්ලුම්කරු වැඩිදුරටත් මූලික සාක්ෂිවල දී මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර: තමා සැළකර සිටින්නේ තමාට හිමි විය යුතු වැටුප් හිමිවුණේ නෑ කියලා ? (පිටුව 64)

උ: ඔව්.

ප්‍ර: මේ පිළිබඳව තමුන් කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් කළා ද?

උ: ඔව්. බදුල්ල කම්කරු කොමසාරිස් කාර්යාලයට පැමිණිලි කළා.

ප්‍ර: එම කාර්යාලයෙන් පරීක්ෂණ මෙහෙයව්වා ද?

උ: බදුල්ල ඌව අධ්‍යක්ෂක මණ්ඩලය කැඳවලා පරීක්ෂණ පැවැත්වූවා.

ප්‍ර: එම පරීක්ෂණය සඳහා පැමිණි නිලධාරීන් එම මුදල් ලබා දෙන්න කැමති වුණා කීවා නේද? (පිටුව 65)

උ: ඔව්.

බදුල්ල සහකාර කම්කරු කොමසාරිස්ගේ 2016.06.15 දින දරන ලේඛනයක් පෙන්වා සිටී. ( A/24 )

ප්‍ර: තමා බදුල්ල කම්කරු කාර්යාලයට ඉදිරිපත් කළ පැමිණිල්ල තමා මේ ?

උ: ඔව්.

පැමිණිලිකරු සහකාර කම්කරු කොමසාරිස් බදුල්ල වෙත 2003.02.20 දිනෙන් යවන ලද පැමිණිල්ලේ පිටපත A21 ලෙස ලකුණු කරන ලෙස ගරු අධිකරණයෙන් ඉල්ලා සිටී.

ප්‍ර: මේ අවස්ථාවේ දී A22 හි සඳහන් පරිදි නියෝජිත මහතා මොකද කිව්වේ ?

උ: නිවාඩු වැටුප් ගෙවීමට පොරොන්දු වුණා. (පිටුව 66)

ප්‍ර: එහෙත් නිවාඩු වැටුප් ගෙවීම සිදු වුණා නේද ?

උ: නෑ. (පිටුව 67)

ප්‍ර: ඒ A23 කියන ලේඛනයේ සඳහන් නියෝගය තිබෙනවා ද ?

උ: (එකී කොටස සාක්ෂිකරු කියවා සිටී.)

1995.12.01 දින සිට 2002.12.31 දින කාලය සඳහා අදාළ නිවාඩු දින වැටුප් මේ දක්වා නොගෙවා ඇත. එබැවින් දින 14ක් ඇතුළත එම මුදල් මෙම කාර්යාලයේ තැන්පත් කරන ලෙසට ඉල්ලා සිටී.

ප්‍ර: එකී මුදල තැන්පත් කළා ද ?

උ: නෑ.

ප්‍ර: මේ පිළිබඳව නැවත පැමිණිලා කළා ද ?

උ: ඔව්.

ප්‍ර: කුමන කම්කරු කාර්යාලයට ද පැමිණිලි කළේ ?

උ: බදුල්ල කම්කරු කාර්යාලයටමයි පැමිණිලි කළේ.

ප්‍ර: නමුත් මුදල් ලැබුණේ නෑ ?

උ: ඔව්. (පිටුව 68)

ප්‍ර: බදුල්ල කම්කරු කාර්යාලයෙන් මෙම පැමිණිල්ල වෙනත් කම්කරු කාර්යාලයක් වෙත මාරු කළා ද ?

උ: ඔව්. මොණරාගල කම්කරු කාර්යාලයට මාරු කළා.

ප්‍ර: මොණරාගල කාර්යාලයෙන් සහනයක් ලැබුණා ද ?

උ: නෑ. නැවත බදුල්ල කම්කරු කාර්යාලයට එව්වා.

ප්‍ර: නැවත මොකද කළේ ?

උ: බදුල්ල කම්කරු කාර්යාලයෙන් කොළඹ මහලේකම් කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශයට එවනු ලැබුවා. (පිටුව 69)

(23) C. <u>ඉල්ලුම්කාර පාර්ශ්වයේ පළමුවන ප්‍රකාශනයෙන් දක්වා ඇති පරිදි මෙම ආරවුල රාජ්‍ය ප්‍රතිපත්තිවලට පටහැනි වීම.</u>

(10) ඉල්ලුම්කාර පාර්ශ්වය තම ප්‍රතිඋත්තර ප්‍රකාශය මගින් මෙසේ දක්වා ඇත. එනම්,

''රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන සහ දක්ෂතා සංවර්ධන අමාත්‍යාංශය මගින් අමාත්‍යාංශ ලේකම්කරුවන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්. දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් අමතා 2001 ඔක්තෝබර් මස 01 වන දිනට දින 180ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ගේ වයස අවුරුදු 45 ඉක්ම වුවද ස්ථිර කිරීම සඳහා ලබා දී තිබූ රාජ්‍ය පරිපාලන 27/2001 චක්‍ර ලේඛයට ආදී කිසිවක් පිළිබඳව කිසිදු ගරු කිරීමක් නොකර වගඋත්තරකාර පාර්ශ්වය 1997 වර්ෂය සඳහා නිවාඩු 25ක් ලබා දී පසුව එම නිවාඩු සඳහා ද ගෙවූ වැටුප් යළි අය කර ගැනීමට කටයුතු කරන ලදී.''

රජයේ දෙපාර්තමේන්තුවල ද වර්තමානයේ පවා ක්‍රියාත්මක වන්නේ මෙම චක්‍රලේඛයයි. එසේ වුවද ඉල්ලුම්කරු තම ප්‍රතිඋත්තරයෙන් දක්වා ඇති පරිදි ඔහුගේ සේවා යෝජක වන මෙම වගඋත්තරකරු අදාළ පරිදි මෙම චක්‍රලේඛ පරිදි ක්‍රියාකර නැත. එසේ වූවා නම් මෙවැනි ප්‍රශ්න පැන නොනගී.

d. බදුල්ල සහකාර කම්කරු කොමසාරිස්ගේ 2016.06.15 දින දරන ලිපිය (A/24) මගින් මෙම ආරවුල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයෙන් නිසි සැලකිල්ලක් නොදැක්වීම. (A/27)

බදුල්ල කම්කරු කොමසාරිස්ගේ 2016.06.15 දින දරන ලිපිය (A24) මගින් මෙම ආරවුල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයෙන් නිසි සැලකිල්ලක් නොදැක්වීම පිළිබඳව (A27) දරන ලේඛනයේ මෙසේ දක්වා ඇත.

''නියෝජ්‍ය කම්කරු කොමසාරිස් බදුල්ල විසින් මෙය විසඳීම සඳහා උත්සාහ ගෙන ඇතත්, ශ්‍රී.ලං.ග.ම. මෙම ප්‍රශ්නය නොසළකා හැර කටයුතු කිරීම මත ඔහුට යම් තීරණයකට පැමිණීමට නොහැකි වී ඇති අතර, කාල විරෝධයට ද හසුවීම මත බේරුම්කරණයට යොමු කිරීම පිණිස ගොනුව කාර්මික සම්බන්ධතා අංශය වෙත එවා ඇත. ගොනුව මෙතරම් විශාල වීමට හේතු වී ඇත්තේ වරින්වර එකම ලියවිලි එකතු කර ගොනු ගත කිරීම නිසා මිස නියමිත ක්‍රියාමාර්ගයක් ඔස්සේ මෙම ආරවුල පිළිබඳව ක්‍රියා කිරීම නිසා නොවේ.

ඌව බස් සමාගම අනියම් සේවකයන් ස්ථිර කිරීම හා සේවකයන්ට නිවාඩු ලබාදීම සම්බන්ධව චක්‍රලේඛ තිබිය දී ඒ අනුව ක්‍රියා නොකිරීම මෙහි දක්නට ලැබෙන ප්‍රබල ප්‍රශ්නයකි. (A27 පිටුව 01)

''ආරවුල විසඳීමට ගෙන ඇති කාලය පිළිබඳව සිතා බැලීමේ දී (වසර 07 කි) ශ්‍රී.ලං.ග.ම. මෙය විසඳීමට උත්සාහයක් නොගන්නා බව පැහැදිලිය.'' (A27 පිටුව 02)

ඉල්ලුම්කරු තම ඉල්ලීම ප්‍රතිඋත්තරය මගින් ද ඉල්ලා ඇත. එහි නිවාඩු වැටුප් වශයෙන් රු. 124,944.76ක මුදල සහ ගමන් වියදම්, නියෝජිත ගාස්තු සහ නවාතැන් වියදම් ලෙස රු. 87,440.00ක මුදලක් ඉල්ලා ඇත.

මෙහිදී ඉල්ලුම්කාර පාර්ශ්වයේ ගණනය කිරීම් පිළිබඳව හෝ වගඋත්තරකාර පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්නවල දී හබකර නැත.

e. මෙම කම්කරු ආරවුල විසඳා ගැනීමට ඉල්ලුම්කාර පක්ෂයට වසර 10ට වැඩි කාලයක් (එනම් අවුරුදු 13 පමණ) ගතවීම.

මෙම කම්කරු ආරවුල විසඳා ගැනීම සඳහා ඉල්ලුම්කරුට වසර 10කට වැඩි කාලයක් (එනම් අවුරුදු 13ක් පමණ කාලයක්) ගතවී ඇති බව ඉල්ලුම්කරුගේ සාක්ෂිවලින්ම පෙනී යයි.

මේ අනුව වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ලිඛිත සැළකිරීම් මගින් මෙම ආරවුල විසඳීම ප්‍රමාදය හේතුවෙන් ඉල්ලුම්කරුට කිසිදු මුදල්මය පාඩුවක් සිදු නොවී ඇති බවට ඉදිරිපත් කරන තර්කය කිසිසේත් පිළිගැනීමට බේරුම්කරණයට නොහැක. එසේම හුදෙක් අනියම් යන වචන මුවාවෙන් අවුරුදු 07 මාස 10ක් අඛණ්ඩව රියදුරකු වශයෙන් ඉල්ලුම්කරු සේවය කර ඇති අතර අනියම් සේවකයන් ස්ථිර කිරීම සඳහාත් එමගින් ඔවුන්ට හිමි නිවාඩු ලබා දීම සඳහාත් ආයතනයේ චක්‍රලේඛවලට අතිරේකව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් සියලුම දෙපාර්තමේන්තු සහ සංස්ථා මණ්ඩල ප්‍රධානීන් අමතා නිකුත් කර ඇති සහ ප්‍රතිඋත්තර ප්‍රකාශය මගින් දක්වා ඇති 27/2001 චක්‍රලේඛය පිළිබඳව ඉල්ලුම්කාර පක්ෂය විසින් නොයෙකුත් අවස්ථාවල දී, වගඋත්තරකාර මණ්ඩලයෙන් විමසීම් කර ඇතත්, එකී ඉල්ලුම්කාර පක්ෂයේ ප්‍රතිඋත්තර ප්‍රකාශය මගින් එකී චක්‍රලේඛය පිළිබඳව කිසිදු තැකීමක් වගඋත්තරකාර මණ්ඩලය විසින් සිදුකර නොමැති බව ද පෙනී යයි.

මේ අනුව බේරුම්කරණය විසින් තීරණය කළ යුතු වන්නේ ඉල්ලුම්කරුට කුමන මූල්‍ය පාඩුවක් සිදුවී තිබේ ද? එය යුක්ති සහගත ද? එය යුක්ති සහගත වේ නම් ඉල්ලුම්කාර පක්ෂයට මෙම බේරුම්කරණය විසින් කුමන සහන ලබා දිය යුතු ද යන්න වේ.

ඒ අනුව පහත සඳහන් පරිදි ඉල්ලුම්කාර පක්ෂයට හිලව් කිරීමක් වශයෙන් පහත සඳහන් මුදල් ගෙවිය යුතු බවට වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

| | |
|---|---|
| (අ) A24 අනුව හිමිවිය යුතු නිවාඩු වැටුප් වශයෙන් ගෙවිය යුතු මුදල | = රු. 46,832.47 |
| (ආ) ඉල්ලුම්කාර පක්ෂයේ ලිඛිත සැළකිරීම් අනුව ගෙවිය යුතු නිවාඩු වැටුප් වශයෙන් අයකර ගත් මුදල ආපසු ගෙවීම | = රු. 29,366.50 |
| (ඇ) මෙම කාර්මික ආරවුල විසඳා ගැනීමට ගත වූ කාලය වෙනුවෙන් ඉල්ලුම්කරුට ලැබෙන වන්දි මුදල (A/24 පරිදි) | = රු. 50,000.00 |
| එකතුව | = රු. 126,198.97 |

ඉහත එකතුව වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිහයදහස් එකසිය අනූ අටයි සත අනූහත (රුපියල් 126,198.97) ක මුදලක් ඉල්ලුම්කාර පක්ෂයට ගෙවිය යුතු බවට වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

තවද ඊට අතිරේකව ඉල්ලුම්කරුගේ හුදෙක් අනියම් සේවා කාලය සඳහා අදළ පරිදි (විශ්‍රාම ගිය දිනය දක්වා) සේ.අ.අ. හා සේ.නි. භා. අ. සඳහා දයක මුදල් ඔහු වෙනුවෙන් ගෙවිය යුතු බවට ද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් වැඩිදුරටත් නියෝග කරමි.

ඉහත කී (අ) (ආ) සහ (ඇ) සඳහන් මුදල් මෙම තීන්දුව හා ප්‍රදනය ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වී එක් මාසයක් ඇතුළත බදුල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට ද වගඋත්තරකාර මණ්ඩලයට නියෝග කරමි.

ඉන්පසුව එකී මුදල් ඉල්ලුම්කාර පක්ෂයට ලබා ගත හැකි බව ද වැඩිදුරටත් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් හා ප්‍රදනයක් කොට මම සලකමි.

පී. දනන්සූරිය,
(බේරුම්කරු)

වර්ෂ 2019 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

07 - 644

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.